# වෙහෙර විහාර තැනීම මහත් පල මහානිසංස ලැබෙන පුණ්‍ය කර්මයක්

මෙවර සන්නස වෙනුවෙන් මා සාකච්ඡාවක යෙදුනේ මෙල්බර්න් හි බෞද්ධ ධර්මය ප්‍රචලිත කිරීම සඳහා වසර 16ක් තිස්සේ ඇප කැප වීමෙන් සේවයක් ඉටු කරන ඩැන්ඩිනොන් හි ධම්මදීප භාවනා මධ්‍යස්ථාන වාසී අකරවිට සංඝානන්ද හිමියන් සමගයි. එම නා හිමියන් ප්‍රමුඛ දායක සභාව විසින් මෙවර වෛශාඛ්‍ය මහෝත්සවය අලලා විශේෂිත වූ බුද්ධ වන්දනා වැඩ සටහනක් සංවිධානය කරනු ලබමින් පවතිනවා. ඒ පිළිබඳව සන්නස පාඨක සැම දැනුවත් කිරීම අප සතු යුතුකමක් ලෙස මා දකිනවා.

ප්‍ර. මෙවර වෙසක් පුණ්‍ය මහෝත්සවය වෙනුවෙන් සංවිධානය කෙරෙන මේ පිංකම ඔබ වහන්සේ විශේෂ කොට සලකන්නේ කුමක් නිසාද යන්න පැහැදිලි කලොත්.....

පි. ඇත්ත වශයෙන්ම මෙවර වෙසක් පුන් පොහොය විශේෂ වන්නේ බුදුන්වහන්සේ බුද්ධත්වයට පත් වී වසර 2600ක් සම්පූර්ණ වීම හේතුවෙන්. මේ නිමිතිකොට ගෙන පුරා දිනක් තිස්සේ පැවැත්වෙන බුදුගුණ වන්දනා සහ ශීල සමාධි වැඩ සටහනක් අප විහාරස්ථානය විසින් සංවිධානය කෙරෙනවා. මීට අමතරව විශේෂ වැඩසටහනක් ඕස්ට්‍රේලියාවේ වෙසෙන විවිධ ජාතීනට අයත් බෞද්ධයන් ගේ එකමුතුවෙන් මෙල්බර්න් නගර ශාලාවේදී ද පැවැත්වෙනවා.

ප්‍ර. මේ බුදුගුණ වන්දනා ශීල සමාධි වැඩ සටහන ගැන සන්නස පාඨක ජනතාව දැනුවත් කිරීම අප සතු යුතුකමක් වනවා. ඒ පිළිබඳව විස්තර කලොත්....

පි. බෞද්ධ කොඩි වලින් අලංකාර කළ මන්දිරයක බෞද්ධ ප්‍රතිමා වහන්සේලා වඩා හිඳුවා වසර 2600ක සංවත්සරය වෙනුවෙන් මල් 2600ක් පූජා කොට පහන් 2600ක් දල්වා, 500ක් දෙනා ශීල සමාදානයෙහි පිහිටුවා ආරම්භ කරන මෙම වැඩසටහන අරමුණු කර ගන්න දවස පුරාම බුදු ගුණ සිහිකිරීමයි. මෙම දිනය බුදු ගුණ සිහි කරමින් බුදු බැතිය වඩවන කාර්යයන්ට සහභාගි වෙමින් ගත කරන දිනයක් බවට පත් වෙනවා. සවස සිල් පවාරණය කිරීමෙන් අනතුරුව පැය 2 ක පමණ කාලයක් බුදු බැති ගී ගායනා කරමින් සැමට සෙත ශාන්තිය ප්‍රාර්ථනා කරනවා.

ප්‍ර. මෙම වැඩසටහන පැවැත්වෙන දිනය සහ ස්ථානය සඳහන් කිරීම වැදගත් වේ යයි මා සිතනවා.

පි. මේ වැඩසටහන පැවැත්වෙන්නේ නෝබල්පාක් භාෂා පාසල් ශාලාවේදී. මැයි 29 දා උදේ 7.00 සිට සවස 6.00 දක්වායි. එදින සහභාගී වන 1000ක් දෙනාට දිවා ආහාරය සපයන්නට කටයුතු යොදා තිබෙනවා. සහභාගි විය හැකි සෑම කෙනෙකුටම මෙම වැඩසටහනට සහභාගී වන ලෙසට අපි ආරාධනා කරනවා. එමෙන්ම ඒ බව අපට දැනුම් දීමක් කලොත් එය සංවිධාන කටයුතු සඳහා පහසුවක් වෙනවා.





ප්‍ර. දශක 2 කට ආසන්න කාලයක් තිස්සේ මෙල්බර්න් වාසී බෞද්ධ ජනතාවට අනුපමේය සේවයක් ඉටු කරන මෙම විහාරස්ථානයට දැනට පවතින ඉඩකඩ සීමිත බව ගැටළුවක් වී ඇති බව පෙනෙනවා.

පි. ඇත්ත වශයෙන්ම මේ අවට වෙසෙන ජනතාව පමණක් නොව දුර බැහැර සිට පවා මෙම විහාරස්ථානයට පැමිණෙන පිරිස දිනෙන් දින වැඩි වෙනවා. මෙම විහාරස්ථානයේ දිනපතා පැවැත්වෙන බෝධි පූජා මල් පිංකමට බොහෝ පිංවතුන් සහභාගි වෙනවා. නේවාසික පරිසරයක පිහිටා ඇති මෙම විහාරස්ථානයට ඇති විශාලම ගැටළුව වන්නේ වාහන ගාල් කිරීමට ඇති ඉඩකඩ සීමිත වීමයි. එමෙන්ම ඉඩකඩ ප්‍රශ්නය නිසා මෙම විහාරස්ථානය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත් කිරීම අපහසු කාරණයක් බවට පත්ව තිබෙනවා. එමෙන්ම විශේෂයෙන් පොහොය දින වැඩසටහන් සඳහා පවතින ඉඩකඩ ප්‍රමාණවත් නැත මේ තත්වයන් මත විහාරස්ථානය වඩාත් ඉඩ පහසුකම් සහිත ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාව දැඩි ලෙස මතුවී තිබෙනවා.

ප්‍ර. අප දන්නා පරිදි ඔබ වහන්සේ ප්‍රධාන දායක සභාව මේ වන විට විහාරස්ථානයේ දියුණුව සඳහා යම් වැඩ පිළිවෙලක් ආරම්භ කොට තිබෙනවා. ඒ ගැන පැහැදිලි කලොත්

පි. මෙම විහාරස්ථානය අංග සම්පූර්ණ ලෙස ස්ථාපිත කිරීම සඳහා දැනට පැකනම් ප්‍රදේශයේ අක්කර 10ක පමණ භූමි භාගයක් මිල දී ගෙන විහාරස්ථානය ඉදිකිරීම සඳහා කටයුතු ආරම්භ කොට තිබෙනවා. මෙම ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියනයක පමණ මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබෙනවා. මෙම සත් කාර්යය කෙරෙන්නේ ප්‍රධාන කොටම මෙල්බර්න් හි වෙසෙන බෞද්ධ ජනතාවගේ පරිත්‍යාග කටයුතු වලිනි. මේ සඳහා අප දායක සභාව විසින් සුබෝධි භාර කාර අරමුදල නමින් අරමුදලක් පිහිටුවා තිබෙනවා. ඕනෑම අයකුට එහි කොටස් මිල දී ගත හැකියි. එසේ කොටස් මිල දී ගෙන මෙම විහාරස්ථානය තැනීමේ මහඟු පුණ්‍ය කර්මයට දායක වන ලෙස මා මෙල්බර්න් වාසී සියලුම බෞද්ධ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

ප්‍ර. මෙම පුණ්‍ය කර්මයට දායක විය හැකි ආකාරය පැහැදිලි කලොත්

පි. මෙම පිනකමට දායක වීමට කැමති ඕනෑම අයෙකුට මෙහි සාමාජික කොටස් මිලදී ගත හැකියි. එම කොටස් මුදල එකවර හෝ කොටස් වශයෙන් ගෙවිය හැකියි. දැනට 150 දෙනෙකු මෙහි කොටස් ලබා ගෙන තිබෙනවා. විහාරස්ථානය ගොඩ නැගීමට යම් කාලයක් ගතවන බැවින් කොටස් වශයෙන් ගෙවීමෙන් ව්‍යාපෘතියේ කටයුතු වලට බාධාවක් සිදුවන්නේ නැහැ. කැමති ඕනෑම අයකුට විහාරස්ථානයට පැමිණ හෝ දුරකථන ඇමතුමක් දිමෙන් විස්තර ලබා ගත හැකියි. (අංක 97949492)

වැවත් දාගැබත් ගමත් පන්සලත් එක්කල ශ්‍රී ලාංකීය ගැමි සංස්කෘතිය සිත් තුල දරාගෙන මව් බිමෙන් බොහෝ සේ දුරස්ව වෙසෙන අපට අප වෙසෙන්නේ විදෙස් රටක යයි නොහැඟෙන්නේ අපට පන්සලේ ඇසුර නොඅඩුව ලැබෙන බැවින්. අපේ දානයට වඩින්නට, අපට ඇවැසි වූ විටක සෙත් පිරිත් සජ්ඣායනා කරන්නට සංඝයා වහන්සේලා නුදුරෙහිම වැඩ සිටින බැවින්, අප දූ දරුවන්ට දහම් සුවඳ බෙදන්නට දහම් පාසල් පවතින බැවින්. එසේ නම් මේ සියල්ල පණ මෙන් රැක ගැනීමේ වගකීම පැවරී ඇත්තේ අන් කවරකු උර මත නොව බෞද්ධයන් වන අප මතයි. දශක දෙකක කාලයක් තුල විහාරස්ථාන 6ක් ස්ථාපිත වූයේ මෙල්බර්න් වාසී බෞද්ධ ජනතාවගේ අප්‍රතිහත ධෛර්යයෙන් එම කැපවීම මෙතනින් අවසන් වන්නේ නැත. එසේ විය යුතු ද නොවේ. ඒ බුදු සසුන තවත් චිරාත් කාලයක් රැක ගත යුත්තතේ බෞද්ධයන් වන අප විසින්ම නිසාවෙනි.

ශ්‍රීනාත් මද්දුමගේ


ABN 399 885 48425

SRI WRECK
TOWING



VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS

24 hours 7 days a week

0433 495 548

udesha@bigpond.com Tel 5995 6105